www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව එල්ටීටීඊය සාම සාකච්ඡා සඳහා කල ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි

**Sri Lankan government rejects LTTE call for peace talks**

**සරත් කුමාර විසිනි**
**2004 දෙසැම්බර් 13**

වඩ වඩා අඩමාන බවට පත් වන වත්මන් සටන් විරාමය මුලුමනින් ම බිඳ වැටෙනු ඇතැයි යන භීතිය තව දුරටත් තීව්‍ර කරමින්, ශ්‍රී ලංකා ආන්ඩුව, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) නායක වේලුපිල්ලෙයි ප්‍රභාකරන් සාම සාකච්ඡා යලි ඇරඹීම සඳහා කල ආයාචනය ප්‍රතික්ෂේප කොට තිබේ.

ප්‍රභාකරන් නොවැම්බර් 27 දා පැවති සිය වාර්ෂික මහා වීර දින කතාවේ දී සාකච්ඡා සඳහා ඉල්ලීම ඉදිරිපත් කලේ ය. කිසිදු විසඳුමකින් හෝ සාකච්ඡා පිලිබඳ බලාපොරොත්තුවකින් තොරව "දේශපාලන රික්තයක්" තුල කාල නියමයක් නැතිව දිගට ම හිරවී සිටීම එල්ටීටීඊයට කල නොහැකි බවටත් එය "සීමා රේඛාවක්" කරා ලඟා වී ඇති බවටත් ඔහු අනතුරු ඇඟවී ය. දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත් සඳහා අන්තර් වාර ස්වයං-පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) පිලිබඳ එල්ටීටීඊයේ යෝජනා මත පදනම්ව සාකච්ඡා ඇරඹිය යුතු යයි ඉල්ලා සිටි ඔහු "සාම ක්‍රියාදාමය" යලි ආරම්භ නොකෙරයි නම් යුද්ධය යලි ඇවිලෙනු ඇතැයි ද ඇඟවී ය.

කෙසේ වෙතත්, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) එම ඉල්ලීම එක හෙලා ම ප්‍රතික්ෂේප කලේ ය. දෙසැම්බර් 1 දා නිකුත් කල නිවේදනයක ආන්ඩුව මෙසේ ප්‍රකාශ කලේ ය: "තනි කාරනාවක් පිලිබඳව ඒකපාර්ශ්විකව අවධාරනය කිරීම මගින් තමන් ම කොන්දේසි ඉදිරිපත් කරන ගමන්, කොන්දේසි විරහිතව සාකච්ඡා යලි අරඹන ලෙස දැන් එල්ටීටීඊය වෙතින් එන, තර්ජනාත්මක භාෂාවකින් ප්‍රකාශයට පත් කෙරුනු, ඉල්ලීම, සද්භාවයෙන් කෙරෙන සාකච්ඡාවන්ට උපකාරී නො වන තරම් ය."

අන්තර් වාර පාලනයක් පිලිබඳ මොන යම් හෝ සාකච්ඡාවක් අවසන් දේශපාලන විසඳුමක් පිලිබඳ සාකච්ඡාවන්ට සම්බන්ධ කල යුතු යයි එජනිසය දිගට ම අවධාරනය කරයි. කෙසේ වෙතත්, ආන්ඩුව, රටේ දිගු කාලීනව ඇදෙන සිවිල් යුද්ධය අවසන් කිරීමේ සම්මුතියක් සඳහා කිසිදු යෝජනාවක් ඉදිරිපත් කොට නැත. එපමනක් නොව, අන්තර් වාර පාලනයක් අවසන් විසඳුමකට ඇඳිය යුතු යයි එය කරන අවධාරනය සම වන්නේ, දැන් උතුර හා නැගෙනහිර පාලනය කිරීමෙහි ලා යම් හිමිකමක් වෙනුවෙන් එල්ටීටීඊය කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමකට ය. 2002 පෙබරවාරියේ දී සටන් විරාම ගිවිසුමට අත්සන් කොට වෙනම දෙමල රාජ්‍යයක් පිලිබඳ සිය ඉල්ලීම අතහැර දමා ඇති එල්ටීටීඊයට එයට හිලව් වසයෙන් කිසිවක් ලැබී නැති තරම් ය.

අප්‍රේල් මැතිවරනයට පෙරාතුව, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ඇගේ සහයෝ, එල්ටීටීඊය සමග කෙරෙන සාකච්ඡාවල දී රට පාවා දී ඇතැයි කියමින් පාලක එක්සත් ජනතා පෙරමුන (එජාපෙ) හෙලා දැක්කහ. කෙසේ වෙතත්, මැතිවරනය ජය ගැනීමෙන් පසුව, කුමාරතුංග, තමන් ම විවේචනයට ලක් කොට තිබූ "සාම ක්‍රියාදාමය" යලි ඇරඹීමට උත්සාහ කලා ය. එමගින් එජනිස හවුල තුල ම භේදයන් හට ගති.

පසුගිය මාස අට තිස්සේ සාකච්ඡා යලි ඇරඹීමට දැරූ ප්‍රයත්න අන්තර් වාර පාලනයක් සඳහා වූ එල්ටීටීඊයේ ඉල්ලීම උඩ නැවත නැවතත් බිඳ වැටී ඇත. අයිඑස්ජීඒ යෝජනා ඒකීය රාජ්‍යයට එනම්, සිංහල බෞද්ධ ආධිපත්‍යයට, වල කැපීමේ තර්ජනය මතු කරන බැවින් ජවිපෙ එම යෝජනා ප්‍රතික්ෂේප කොට තිබේ. හිරවීම දිගට ම ඇදී යද්දී, සාපේක්ෂව සුලු මට්ටමේ වුවත්, සන්නද්ධ ගැටුම් වැඩෙමින් පවතී. විශේෂයෙන් ම, කරුනා නමින් ප්‍රසිද්ධ වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් එල්ටීටීඊ කන්ඩායමක් මේ වසර මුල දී සංවිධානයෙන් බිඳී වෙන් වූ නැගෙනහිර පලාතේ එලෙස ගැටුම් වැඩෙමින් පවතී.

යුද්ධය විවෘතව ම ඉල්ලා නො සිටින නමුදු, එජනිස ආන්ඩුව, කෙසේ වෙතත්, ඒ සඳහා සූදානම් වේ. පසුගිය සඳුදා නියෝජ්‍ය ආරක්ෂක ඇමති රත්නසිරි වික්‍රමනායක, ආරක්ෂක වියදම් තව දුරටත් වැඩි කිරීමට සහයෝගය දෙමින්, පාර්ලිමේන්තුවේ දී ජාත්‍යොන්මාදවාදී කතාවක් කලේ ය. "මිනිස් බලය, ද්‍රව්‍ය, අදහස් හා ආයුධ අතින් අපි සන්නද්ධ හමුදාවන් ශක්තිමත් කරන්නෙමු,... මෙම සෙවරී ජාතියට එල්ල වන ඕනෑම තර්ජනයකට මුහුන දීමට අපි සූදානම් වෙමු." යයි ඔහු ප්‍රකාශ කලේ ය.

ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සිය සහයෝගය ප්‍රකාශයට පත් කරමින්, උද්යෝගීව තම මේසවලට තඩි බාමින් ප්‍රතිචාර දැක්වූහ. අයිඑස්ජීඒ මත පාදකව සාකච්ඡා ආරම්භ කල හොත් තම පක්ෂය තම අභිමතය

පරිදි එම ප්‍රශ්නයට මැදිහත් වනු ඇතැයි ප්‍රමුඛ ජවිපෙ නායක නන්දන ගුනතිලක නොවැම්බර් අග දී ඇඟවුම් කලේ ය. “අයිඑස්ජීඑ හරහා රට බෙදීමට විරුද්ධව දකුනේ තරුනයන් ආයුධ අතට ගත හොත් ටීඑන්ඒ (එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානය) ඒ පිලිබඳව වගකිව යුතු” යැයි ඔහු අනතුරු ඇඟවී ය. ජාතික හෙල උරුමය (ජාහෙඋ) වැනි සෙසු සිංහල ස්වෝත්තමවාදී සංවිධාන ද ඒ සමාන තර්ජන සිදු කොට තිබේ.

මිලිටරි වියදම් රුපියල් බිලියන 56 (එ.ජ. ඩොලර් මිලියන 541) දක්වා, නැත හොත් පසුගිය වසරට සාපේක්ෂව සියයට 8කින්, ඉහල දැමූ ආරක්ෂක වැය ශීර්ෂය 140ක දැවැන්ත බහුතරයකින් සම්මත විය. වැඩි කෙරුනු ආරක්ෂක වියදම්වලට විරුද්ධ වූ එකම පාර්ලිමේන්තු කන්ඩායම වූයේ, තනි දෙමල මන්ත්‍රීවරු දෙදෙනකු සමග ටීඑන්ඒ සංවිධානය යි.

විපාර්ශ්වික එජාපෙ ආරක්ෂක වියදම්වලට ඡන්දය දුනි. ඒ පිලිබඳව අදහස් දක්වමින් දෙසැම්බර් 5 දා එජාපෙ නායක රනිල් වික්‍රමසිංහ ප්‍රකාශ කලේ “ශ්‍රී ලංකාව නොවැලැක්විය හැකි ලෙස යුද්ධය දෙසට තල්ලු වී යන” බව යි. “සාම සාකච්ඡා සඳහා පියවර” ගැනීමට අසමත් වීම පිලිබඳව එජනිසයට දොස් කියමින් ම, ඔහු කෙසේ වෙතත්, ආන්ඩුවේ යුද සූදානමට සහයෝගය දුනි.

නෝර්වේජියානු විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම් දෙපාර්ශ්වය ම සමග තව දුර සාකච්ඡා සඳහා අද කොලඹට පැමිනීමට නියමිත ය. ඉහල මට්ටමේ නෝර්වේර්යානු නියෝජිත කන්ඩායමක් කිසිදු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අසමත් වීමෙන් යන්තම් සති කිහිපයකට පසුව පැමිනෙන සොල්හෙයිම්, හිර වීම බිඳ යම් ආරම්භකත්වයක් ගැනීමට සමත් වනු ඇතැයි කිසිවෙකුට වත් සාරදර්ශනයක් නැත. ප්‍රන්ස පුවත් සේවය කොලඹ එක් තානාපති නිලධාරියකු මෙලෙස රලු ආකාරයකින් කල ප්‍රකාශයක් උපුටා දැක්වී ය: “සංචාරය මුලුමනින් ම පාහේ සැලකෙන්නේ යම් ආකාරයකින් සම්බන්ධතාව පවත්වා ගෙන යාමේ අභ්‍යාසයක් ලෙස මාසිකව කෙරෙන රටාවාදී ක්‍රියාවක් හැටියට ය.”

උතුරු හා නැගෙනහිර පලාත්වල ආතතීන් අඛන්ඩව වැඩෙයි. දෙසැම්බර් 2 දා ශ්‍රී ලංකා මිලිටරිය, උතුරේ යාපන අර්ධද්වීපය සමග දකුන යා කරන ප්‍රධාන මාර්ගය වන ඒ 9 මහා මාර්ගය ඒකපාර්ශ්විකව වසා දැම්මේ ය. එය වනාහි සටන් විරාමය අත්සන් කිරීමෙන් පසුව එම මාර්ගය එසේ වසා දැමුනු ප්‍රථම වතාව යි. පසුගිය වසර දෙකක කාලය මුලුල්ලේ එම මාර්ගයේ ගමනාගමනයට බලපාන ඕනෑම තීන්දුවක් ගනු ලැබ ඇත්තේ එල්ටීටීඊයේ ද මතය විමසීමෙනි. වවුනියාවේ හා මන්නාරමේ එල්ටීටීඊය සංවිධානය කල විරෝධතා ව්‍යාපාරවලට මහජනයා එක් වීම වලකනු පිනිස එලෙස මහා මාර්ගය වසා දැමීම අවශ්‍ය යයි මිලිටරිය අවධාරනය කලේ ය.

දෙසැම්බර් 3 දා, හමුදාව, එල්ටීටීඊයේ පාලනයට යටත් යාපන අර්ධද්වීපයේ නැගෙනහිර කොටසේ පිහිටි වඩමාරච්චිවලට විදුලි උත්පාදක යන්ත්‍ර ගෙනයාම වලකාලී ය. ගම්මු ආගමික උත්සව සහ විවාහ මංගල උත්සව වැනි සෙසු පොදු කටයුතු සඳහා මෙම උත්පාදක යන්ත්‍ර පාවිච්චි කරති. පසුගිය සඳුදා, ශක්ති රූපවාහිනී ජාලයට අයත් යාපනයේ පිහිටි සම්ප්‍රේෂන මධ්‍යස්ථානයකට බලාත්කාරයෙන් ඇතුලු වූ “නාඳුනන කන්ඩායමක්” එයට අලාභ හානි සිදු කොට තිබේ. ආන්ඩුව, මිලිටරිය සහ විවිධ සිංහල අන්තවාදී කන්ඩායම් සලකන්නේ එම රූපවාහිනී ජාලය එල්ටීටීඊයට හිතැති එකක් ලෙස ය.

නැගෙනහිර පලාතේ දී, දෙසැම්බර් 7 දා, මඩකලපුව එල්ටීටීඊ දේශපාලන කාර්යාලයට අත් බෝම්බ හතරක් දමා ගසන ලදි. එම බෝම්බ ප්‍රහාරය කරුනා කන්ඩායමේ වැඩක් යයි සැක කෙරේ. එදින ම, එල්ටීටීඊයට විරුද්ධ මෙන් ම ශ්‍රී ලංකා මිලිටරිය සමග සබඳතා පවත්වාගෙන යන සන්නද්ධ කන්ඩායමක් වන දෙමල ඊලම් විමුක්ති සංවිධානයේ (ටෙලෝ) දේශපාලන කාර්යාලයකට ද බෝම්බ එල්ල විය.

ව්‍යාපාරික නායකයෝ රට යලි යුද්ධය කරා තල්ලු වී යාම පිලිබඳ සිය භීතිය නැවත නැවතත් ප්‍රකාශයට පත් කර ඇත. සටන් විරාමයක් හා දේශපාලන විසඳුමක් ඉල්ලා දැඩි ලෙස බලපෑම් කර ඇති ඔවුහු යම් ආකාරයකින් එදිරිවාදිකම් යලි ඇවුලුන හොත් විදේශ ආයෝජන ඉක්මනින් ම හිඳී යනු ඇතැයි උත්සුක වී සිටිති.

නොවැම්බර් අග දී, ශ්‍රී ලංකා වානිජ මන්ඩලයේ සභාපති දේව රුද්‍රිගු, සාම සාකච්ඡා නොපැවැත්වීම පිලිබඳව කොලඹ දේශපාලන සංස්ථාපිතයට දොස් පැවරී ය. “දකුනේ දේශපාලන පක්ෂ බොහොමයක් අයිඑස්ජීඒ ප්‍රතික්ෂේප කිරීම මගින් සාමය අනතුරේ හෙලන්නේ” යැයි ඔහු අනතුරු ඇඟවී ය. ව්‍යාපාරික කාන්තාවක වන නීලා මරික්කාර් එම සම්මන්ත්‍රනයේ දී ම විවෘතව ම මෙලෙස ප්‍රකාශ කලා ය: “ශ්‍රී ලංකාවේ (දේශපාලන) පක්ෂ අත තව මත් විශ්වාසනීය විසඳුමක් නැත.”

කම්කරු පන්තිය භේද කිරීමේ විධි ක්‍රමයක් ලෙස දශක ගනනාවක් තිස්සේ සිංහල ස්වෝත්තමවාදයට උඩ ගෙඩි දී ඇති කොලඹ ව්‍යාපාරික ප්‍රභූව, සිය ලාභ පිලිබඳව උත්සුක වන අතර ම, තමන්ගේ ම සහායෙන් නිර්මානය කෙරුනු ව්‍යසනය අවසන් කිරීමෙහි ලා සිය දේශපාලන සේවකයන්ට වඩා වැඩි සමත්කමක් නොදක්වයි.

© www.wsws.org